# වින්දනයේ සියුම් තැන්

ඩබ්.එම්.එල්.එම්.කේ.විජේතිලක

ගුණසේකර ගුණසෝමයන් විසින් 2013 සැප්තැම්බර් මස ප්‍රථම වරට මුද්‍රණය කරන ලද "සටනක් මැද සටනක්" යොවුන් නව කතාවෙහි මෙරට 70 දශකයේ මුල් භාගයයි. කතුවරයාගේ ගැමි පරිසරය පසුබිම් ගතවූ මෙම නවකතාව තුළින් පාසල් සිසුවෙකුගේ අවධියේ සිට ජීවිතයේ ලබන විවිධ පන්නරයන් දුක්, සතුටු, සිනා, කඳුළු, අපූර්ව ලෙස විග්‍රහ කෙරේ. එමෙන්ම මෙහිදී දුක්ඛිත පරිසරයක ජීවත්වන දෙමාපියන් තම දරුවන්ගේ සිහින තුළින් විශ්‍රාන්තියක් ලබන අයුරු ද ගම්‍ය කර ඇත.

.

විශ්‍රාන්තිය යනු විශේෂයෙන් මවා පානු ලබන කාරණයක්ම නොව ඇතැම් විටෙක උපයා ගත යුතු ඇතැම් විටෙක උපයා දිය යුතු සහ තවත් විටෙක නිරායාසයෙන් ම අත්විඳින වින්දනයන් ය. හදවතේ ලැගුම් ගන්නා සොඳුරුතම මිනිසුන් රැසක් සමග ජීවිතයේ විශ්‍රාන්තිය සොයා ගිය මිනිසුන්ගේ කතාව අපූරුවට ගොඩනැගෙන කතාන්දරයක් මෙහි අපූරුවට පෙළගස්වා ඇත.
පාසල ඇරිය පසු පොත් ගොන්න සමග තෑගි පාර්සලය තුරුළට ගත් මා නිවස බලා ඉගිළ ගියේ, හදවතේ උතුරා ගලා යන නිම් හිම් නැති සතුට අතරිනි. එහෙත් ඉදිකඩුල්ල පනින විට එම සතුට බොඳ වී ගියේ ගෙම්දුලට වී පෙර මග බලා සිටින අම්මා සහ ලොකු අම්මා සමග පොඩි අක්කා රැඳී සිටින බැවිනි. මන්ද පොඩි අක්කා පාසලේ සිට මටත් පෙර නිවසට පැමිණ මාගේ ජයග්‍රහණයන්ගේ නැවුම් බව මටත් ඉතිරි නොකර ඇය එම සියල්ලම පවසා ඇතැයි මට සිතුණ හෙයිනි.
"දොස්තර මහත්තයා ඔහොම සෙප්පඩයා වගේ ඇවිදින්නේ නැහැ නේ, අඩි බර තියලා අහංකාර විදිහට ආඩම්බරයෙන් එන්න ඕනනේ"යි පැවසූ ලොකු අක්කා හඬ නගා සිනාසුණේ ය... එවිට පෙරමගට දිව ආ අම්මා, මා ආදරයෙන් වැළඳගත්තේ හාදු වැස්සක් වගුරවමින් ය... "මේක දොස්තර කෙනෙක් වෙනවට, මේ ලියලා පළවෙනියගේ තෑග්ග ගත්තට, මේක පන්තියේ දෙවැනියා වුණාට" යැයි පවසමින් අම්මා හාදු එකින් එක දෙමින් මා සිප ගත්තේ සතුටු කඳුළු වගුරවමින් ය... මාද අම්මා වැළඳ ගනු ලැබුවේ කඳුළු පිරි දෙනෙතින් යුතු අසීමිත වූ ආදර කරුණාව මුහුණ තුළ සඟවා ගනිමිනි. දොරකඩ උළුවස්ස දෙපසට දෑත බර දී අප්පච්චී අප දෙස සිනාසෙමින් හිටියේ ඉමහත් සතුටින් ය.
''අප්පච්චිගේ ඉස්සරහ කොහොඹ ගහ ළඟ බුදු කුටියට හැමදාම මල් පහන් පූජා කරන විදිය දිහා බලාගෙන ඉන්න එකත් හිතට මහ සැනසීමක්... මං මේ කැලේ පැනලා වෙදකම් අත්හැරලා දැම්මට, මේ ගමේ හත්මුතු වෙද පරම්පරාවම මාගේ නේ. අප්පච්චී, සීයා, මුත්තා, මීමුත්තා, හත්මුතු පරම්පරාවම වෙද්දු. ''මේ ලෝකයේ සීමාවන් අතහරිමින් ජීවිතය දෙස බලන්නට ඇයට තිබුණු හැකියාව කවදත් මගේ හිත කොනක ඇය කෙරෙහි ආදරයක් ඇති කරපු බව නම් ඇත්ත...''
වින්දනයක් නොව සතුට, සොම්නස, මානසික වියවුල්වලින් තොර බව යනාදී කරුණු තුළින් ද ග්‍රහණව දිගහැරෙන්නක් බව මෙම නවකතාව තුළින් මැනවින් තීව්‍ර වේ. අන්‍යෝන්‍ය සම්බන්ධතා මත ගොඩනැගෙන මානසික හැඟීම් තුළින් ජීවිතයේ විශ්‍රාන්තිය ගොඩ නැගෙන බව මෙමගින් පැහැදිළි වේ. මෙනිසා "සටනක් මැද සටනක්" යොවුන් නවකතාව නවකතාවක් ලෙසම පමණක් නොව මෙකී සුවිශේෂතාව විනිසවමින් දිගහැරෙන්නක් බව මොනවට සනාථ වේ.

තමන් දන්නා සීමිත පරිසර වපසරිය තුළ සිට අසීමිත වූ ලෝකයේ සෑම අහුමුළුවක්ම පීරා බැලීමට තම දරුවන්ටම කැපවන දෙමාපියන්ගේ සිහින දරුවන්ගේ සිහින තුළින් විශ්‍රාන්තිය ලබන අයුරු මෙම පොත තුළින් ගුණසේකර ගුණසේන විසින් විදහා දක්වා ඇත.

ගුණසේන ගුණසේකර, (2013) සටනක් මැද සටනක්, ෆාස්ට් ප්‍රින්ටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්, 165, දේවානම්පියතිස්ස මාවත, කොළඹ 10.